# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,805 — 1959 ජූලි 10 වැනි සිකුරාද—10.7.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1929 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1929 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 1930 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | |
| ආණ්ඩුවේ නිවේදන... ... ... | 1931 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1934 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1959 අංක 293**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

ඒ. 197/59.

1959 ජූනි මස 6 වැනි දින සිට කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා (සී.සී.ඇස්.) දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ කෘෂිකර්ම හා ධීවර අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම් කේ. අල්වාපිල්ලයි මහතා (ඕ.බී.ඊ) සවකීය රාජකාරිවලට අතිරේකව ආහාර කොමසාරිස් සහ ආහාර සැපයීමේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 207/59.

1959 ජූනි මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු අමාත්‍යාංශයේ සථිර ලේකම් සී. බී. කුමාරසිංහ මහතා සවකීය රාජකාරිවලට අතිරේකව කම්කරු කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 108/59.

1959 ජූනි මස 18 වැනි දින සිට තෙ. මසකට හෝ නැවත නියමයක් කරන තුරු හෝ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් පී. ඊ. වීරමන් මහතා සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් වශයෙන් තාවකාලිකව වැඩ බැලීමට.

ඒ. 186/59.

1959 ජූනි මස 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු නියෝජ්‍ය විභාග කොමසාරිස් ඇස්. ඊ. ආර්. පෙරින්පනායගම් මහතා විභාග කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 186/59.

1959 ජූනි මස 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර විභාග කොමසාරිස් එච්. ඇල්. විමලසූරිය මහතා නියෝජ්‍ය විභාග කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 167/59.

1959 මැයි මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියේ පළමුවන ශ්‍රේණියේ නිලධාරියකු වන ජේ. ඒ. ඇම්. ද සිල්වා මහතා කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්.

ඒ. 166/59.

1959 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පංතියේ පළමුවන ශ්‍රේණියේ නිලධාරියකු වන වී. ඥානගුරු මහතා මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 ජූලි මස 6 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 296**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑ්ඒ.21/48.

ඒ. ඊ. ආර්. කොරයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 ජූලි 17 වැනි දින, නාවලපිටියේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 6,553 නඩුව ඇසීමට හා 1959 සැප්තැම්බර් 11 වැනි දින, ගම්පොළ මහේස්ත්‍රාත් උසාවියේ අංක 8,081 නඩුව ඇසීමට, ගම්පොල අතිරේ මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑ්ඒ.46/48.

ඒ. ඊ. ආර් කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 සැප්තැම්බර් 14 වැනි දින, නුවරඑළියේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 15,695 නඩුව ඇසීමට, නුවරඑළියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ.31/48.

පී. මාරපන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජයකෝන් මහතා 1959 ජූනි 29 වැනි දින, මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 70/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බතෝලමියුස් මහතා 1959 ජූනි 27 වැනි දින, පටන් 29 වැනි දින දක්වා, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 70/ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. වී. එච්. ලාබ්‍රෝයි මහතා 1959 ජූනි 29 වැනි දින, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1959 ජූලි 4 වැනි දින පටන් 11 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.58ඩී/59.

එස්. සෙල්ලයියා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. කන්නුදුරේ මහතා 1959 ජූලි 1 වැනි දින පටන් 6 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ මල්ලකම් උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : 62ඒ/57.

ජේ. එෆ්. ඒ. සෝස මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, I. එෆ් බිලාසේ මහතා 1959 ජූලි 6 වැනි දින, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 40/48.

බී. ආර්. ජී. විජයකෝන් මහතා 1959 ජූලි 7 වැනි දින, දඹුල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 8,914 නඩුව ඇසීමට, මහනුවර මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 31/48.

එස්. සෙල්ලයියා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 ජූලි 3 වැනි හා 4 වැනි දිනයන්හි, මහනුවර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 12,011 නඩුව ඇසීමට මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ.21/48.

ටී. බී. යටවර මහතා 1959 ජූලි 10 වැනි දින, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 6,155 නඩුව ඇසීමට, මහනුවර, ගම්පොල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය. ජේඒ. 31/48.

බී. ආර්. ජී. විජයකෝන් මහතා 1959 ජූලි 8 වැනි දින, තෙල්දෙණියේ රික්වැස්ට් උසාවියේ අංක 1,931 නඩුවේ තීන්දුව දීමට, දුම්බර, තෙල්දෙණිය උසාවියේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය. පීඑල්/සී. 8/48.

සී. එල්. පෙරේරා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. රුද්‍රිගු මහතා 1959 ජූනි 29 වැනි දින පටන් 1959 ජූලි 3 වැනි දින දක්වා, මීගමුව දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ ඒ. බී. දකුණු අළුත්කුරු කෝරලේ මරිගිරි සියනෑ කෝරලේ (අධිකාරි පත්තුවේ) ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ. 23/57.

පී. ආර්. රාජේන්ද්‍ර මහතා 1959 ජූලි 8 වැනි දින, තෙල්ලිපෙලෙයි ගම්බද උසාවියේ අංක : සීආර්එම්. 1,266 නඩුව ඇසීමට, යාපන දිස්ත්‍රික්කයේ උතුරු හා නැගෙනහිර ලලිකාමම්, වඩමරාච්චි හා යාපනේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/වයි.3/51.

එන්. එම්. යුසුප් මහතා නැති අතර, පී. එස්. මහලේකම් මහතා 1959 ජූලි 3 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර හා උඩ දුම්බර ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්.3/50.

ඩබ්ලිව්. ජී. උඩුගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. බී. ඇල්ලෙපොල මහතා 1959 ජූලි 1 වැනි හා 2 වැනි දිනයන්හි, මහනුවර දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/කේ. 1/48.

එම්. බී. කප්පාගොඩ මහතා නැති අතර, පී. එස්. මහලේකම් මහතා 1959 ජූලි 7 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර උඩ පලාත, උඩ බුලත්ගම හා යටිනුවර (දෙල්පිටිය උසාවියේ) අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 ජූලි 2 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

---

## වෙතන් පත් කිරීම්

**1959 අංක 297**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/92/ (එම්. එෆ්.).

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා මහතා 1959 ජූනි මස 19 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ ආයතන පාලක වශයෙන්.

අංකය : 74/2/37 (එම්. එෆ්).

සී. ඒ. කුරේ මහතා 1959 ජූනි මස 30 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයෙහි සේවයෙහි යෙදීමට.

අංකය : 74/2/132 (එම්. එෆ්).

ටී. පද්මනාදන් මහතා 1959 ජූනි මස 9 වෙනි දින පටන් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

ආර්. ඩබ්ලිව්. වික්‍රමනායක මහතා 1959 ජූනි මස 9 වෙනි දින පටන් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

අංකය : 74/48 (එම්. එෆ්).

එල්. එස්. පෙරේරා මහතා 1959 ජූනි මස 22 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1959 ජූලි මස 6 වෙනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1.

---

**1959 අංක 298**

ඊබී/ඒ.204/2.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිඩ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව සවදෙශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත නැත් පත් ඕ. ආර්. රයිට් මහතා, සවකීය රාජකාරි වලට අතිරේක වශයෙන්, 1959 ජූනි මස 16 වැනි දින සිට, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් නියෝජ්‍ය පිස්කල්.

ඇස්. සී. ප්‍රනාන්දු,
ස්ථිර ලේකම්.

1959 ජූලි මස 1 වැනි දින,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාලයේ දීය,
කොළඹ 7.

**1959 අංක 299**

මගේ අංකය : ඊබී/ඒ—258.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමති තුමා පහත සඳහන් පත්වීම කිරීමට සතුටු වී ඇත :—

නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත නැන්පත් ඕ. ආර්. රයිට් මහතා, 1959 ජූනි මස 16 වැනි දින සිට, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන්, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රොල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

ඇස්. සී. ප්‍රනාන්දු.
සචිර ලේකම්.

1959 ජූලි මස 1 වැනි දින,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති කාර්යාලයේ දීය,
කොළඹ 7.

---

**1959 අංක 300**

1951කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 14 වැනි වගන්තිය යටතේ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අක්කරෙයි පත්තු ක්වාසි විනිශ්චය මණ්ඩලයේ අංක සී 767, සී 768 සහ සී 769 දරණ නඩු විභාගකොට තීරණය කරනු වස් එරාවූර්හි අංක 3 දරණ කොට්ඨාශයේ පදිංචි ඉසාලෙබ්බේ මොහොමඩ් ඉස්මායිල් මහතා විශේෂ ක්වාසි හැටියට අක්කරෙයි පත්තු කොට්ඨාශයට පත් කරන්ට යෙදුනා ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සචිර ලේකම්.

1959 ජූනි මස 4 වැනි දින,
කොළඹදීය.

**1959 අංක 301**

සන්මුගම් කන්දසියා පොන්නම්පලම් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සචිර ලේකම්.

1959 ජූනි මස 25 වැනි දින,
කොළඹදීය.

---

**1959 අංක 302**

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 වැනි පරිච්ඡේදය)**

ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා විසින් ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6(1) වැනි ඡෙදය යටතේ පුත්තලමේ කච්චේරියේ ලංකා සිවිල් සේවයේ නියුක්ත පී. එච්. ප්‍රේමවර්ධන (කැඩෙට්) මහතා, ඔහුගේ රාජකාරිවලට අතිරේක වශයෙන් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඉඩම් නිලධාරියෙකු වශයෙන් 1959 ජූලි 1 වැනි දින සිට පත් කරන ලදී.

සී. බී. පී. පෙරේරා,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්.

කොළඹ, 1959.6.29.

---

**1959 අංක 303**

**1950 අංක 25 දරණ ආහාර පාලන පනත යටතේ පත් කිරීම**

1950ගේ අංක 25 දරණ ආහර පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ කොළඹ මුහන්දිරම්ගේ සොළමන් ද සිල්වා මහතා මුළු දිවයිනේ සහකාර ආහාර පාලකයෙකු වශයෙන් 1959 ජූනි 15 වෙනි දින සිට පත් කොට තිබෙන බව මින් දන්වමි.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති.
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්.

1959 ජූලි 4 වෙනි දින,
ආහාර කොමසාරිස් කාර්යාලය,
330, යූනියන් පෙදෙස, කොළඹ 2.

---

## ආණ්ඩුවේ නිවේදන

අංකය : 51/3 (වැ. සහ අ. පි.)

වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ (296 වැනි පරිච්ඡේදය) අංක 5 (3) දරණ වගන්තිය යටතේ ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල සහ ක්‍රමය පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් ආර්. ඇම්. ගිබන් මතිපෙනි මහතා වෙනුවට ඩී. ජී. එල්. මිසෝ මහතා 1959 ජූනි මස 15 වැනි දින සිට පත්කර තිබේ.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්ගේ අණ පරිදි,

ස්ටැන්ලි ද සොයිසා,
මුදල් ඇමති.

1959 ජූනි මස 26 වැනි දින,
මුදල් ඇමති කාර්යාලය,
කොළඹ.

---

ඇල්.ඩී.—බී. 32/40.

රා. ආ. වි. අ. අංකය : ඒ/පී. 20/62 (58).

**අපරාධ නඩු විධාන සංග්‍රහය**

**2 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

(16 වෙනි පරිච්ඡේදය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 2 වෙනි වගන්තිය යටතේ ඌව පළාතේ ලුනුගල පිහිටි පොලිස් මුරපොළ පොලිස් ස්ථානයක් බවට රජය විසින් ප්‍රකාශ කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශූ. ද සොයිසා,
ස්ථාවර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1959 ජූනි මස 29 වෙනි දින,
කොළඹ දී ය.

---

මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ගොඩ්වින් වීරවර්ධන රත්නායක මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සචිර ලේකම්.

1959 ජූනි මස 25 වැනි දින,
කොළඹදීය.

# 4 බී පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියා පදිංචි කිරීමේ කොමසාරිස් තැන්පත් ඇල්ප්‍රෙඩ් ඇඩ්වින් ගොගර්ලි මොරගොඩ වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුඬවන සෑම අයෙකුගේ ම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

ඒ. ඊ. ජී. මොරගොඩ,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් තැන.

1959 ජූලි 6 ද, කොළඹ.

## උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| M 7572—6.7.51 | .. | පිටර් සුරොන්මෙයි අන්තෝනි ක්‍රූස් ප්‍රනාන්දු, නො. 86, එස්ප්ලනේඩ් පාර, මාතලේ | ජෝජ් අම්මාල් (භාර්යාව), තුසනේවිස් රාජේස්වරී (දුව), ජොසපින් මරියා කනුතා (දුව) |
| M 8777—31.7.51 | .. | වීරප්පා පිල්ලෙයි මුතුසාමි පිල්ලෙයි, 498, කෙලින් වීථිය, මාතලේ | සෙල්ලම්මාල් (භාර්යාව), සෝමසුන්දරම් (පුතා), ෂන්මුගම් (පුතා), සිවඥනම් (පුතා) |
| P 1054—28.9.50 | .. | පෙරියම්බලෙයි රෝසා, මවුන්ට් වර්නන් වත්ත, පතන | පොන්නම්මාල් (භාර්යාව), තනලෙච්චිමි (දුව), සෙල්ලම් (දුව) |
| P 1157—29.9.50 | .. | වෙන්ගදසාලම් වීරසාමි, පූන්කන්ද කොටස, මවුන්ට් වර්නන් වත්ත, පතන. | අලාර්මෙල් (භාර්යාව), පාක්කියම් (දුව), අයියසාමි නොහොත් වීරසියා (පුතා), නාගමුතු (පුතා) |
| P 1252—26.9.50 | .. | සින්නන් සින්නමුතුසාමි, මවුන්ට් වර්නන් වත්ත, පතන | පප්පායි (භාර්යාව), සින්නතම්බි නොහොත් වෙන්ගදසාලම් (පුතා), පලනියම්මාල් (දුව), රාමසියා (පුතා), මුත්තායි (දුව), නල්ලම්මා නොහොත් පවලායි (දුව) |
| P 1433—29.9.50 | .. | කුප්පන් මුතුසාමි, පෙයාර් පීල්ඩ් කොටස, මවුන්ට් වර්නන් වත්ත, පතන | පෙරියම්මාල් (දුව) |
| P 1901—25.10.50 | .. | පලනිමුතු මාරුතෙයි, වූට්න් වත්ත, කොටගල | කාම්ච්චි (භාර්යාව), සුප්පයියා (පුතා) |
| P 2005—25.10.50 | .. | රගවාන් සින්නයියා, කෙල්ලියෙවත්ත, වත්ත, පතන | පාර්වතී (භාර්යාව), වරතම්මා (දුව), ජනයී අම්මා (දුව), ලෙච්චමන් (පුතා), රාමන් (පුතා), අමරාවතී අම්මා (දුව) |
| P 2152—25.10.50 | .. | පෙරියා ව්‍යාපුරි කත්තන්, බෝගහවත්ත, වත්ත, පතන. | ගෝවින්දම්මාල් (භාර්යාව) |
| P 2575—13.11.50 | .. | සෙල්ලන් රාමන්, තැපැල් කාර්යාලය, පතන | අන්නපූරනම් (භාර්යාව), සෙල්ලම් නොහොත් මුත්තම්මා (දුව), සෙවනම්මා (දුව), මුතුසාමි (පුතා) |
| P 2926—25.10.50 | .. | අදෙයික්කන් සිවසාමි, බෝගහවත්ත වත්ත, කොටගල | කරුප්පායී (භාර්යාව), වේලායී (දුව), අලගාර් (පුතා), වසන්තරාදේවී (දුව) |
| P 3548—20.10.50 | .. | අසියකන්නු සවාරිමුත්තු, ග්ලෙන් ලියන් වත්ත, අග්‍රපතන | පක්කියම් නොහොත් පක්කිරියම්මා (භාර්යාව), අන්නාමාරි (දුව) |
| P 3777—30.11.50 | .. | පලනි කන්දසාමි, දිඹුල වත්ත, පතන ... | අන්ජලෙයි (භාර්යාව), මූකායි (දුව) |
| P 4079—18.11.50 | .. | රාජගෝපාල් වේළු, පහළ කොටස, දිඹුල වත්ත, පතන | පෙරියා වල්ලී නොහොත් වල්ලිඅම්මා (භාර්යාව) |
| P 4201—30.11.50 | .. | වීරමුතු පොන්නන්, කුඩා ඩ්රේටන් වත්ත, කොටගල | පක්කියම් (භාර්යාව), අරුමුගම් නොහොත් වීරන් (පුතා) |
| P 4616—4.12.50 | .. | සුප්‍රායන් පෙරුමාල්, ඩ්රේටන් වත්ත, කොටගල | එල්ලම්මාල් (භාර්යාව) |
| P 4631—9.12.50 | .. | පෙරියසියා සෙල්ලයියා, තප්‍රොබේන් කොටස, ස්ටෝනික්ලිප් වතුයාය, කොටගල | රත්නම්මාල් (භාර්යාව), සවුන්දරලින්ගම් (දුව), විශ්වනාතන් (පුතා), සාන්තකුමාරි (දුව) |
| P 5023—30.11.50 | .. | වයිති මූනියන්ඩි, ඩිවොන් වත්ත, තලවකැලේ ... | නල්ලම්මාල් (භාර්යාව), වයිතිලින්ගම් (පුතා), තන්ගමාල් (දුව) |
| P 5038—30.11.50 | .. | ඉන්නයිමුතු පලනිමුතු, ඩිවෝන් වත්ත, තලවකැලේ | සවුන්දරම් (භාර්යාව), වනතුමේරි (දුව), සන්දනම් (පුතා), ජයමනී (දුව), පක්කියම් (දුව), තියගසතියනේසන් (පුතා) |
| P 5107—30.11.50 | .. | පාවුල් මූකන්, ඩිවෝන් වත්ත, තලවකැලේ ... | සමාතානම් (භාර්යාව) |
| P 5223—1.11.50 | .. | පවා නන්නුසයිබු, ග්ලෙන් ලියන් වත්ත, අග්‍රපතන | ඉමම් බීවි (භාර්යාව) |
| P 5289—1.11.50 | .. | මාරියන් නොහොත් රායප්පන් සින්නප්පන්, ග්ලෙන් ලියන් වත්ත, අග්‍රපතන | සේවතියම්මා (භාර්යාව), අන්තෝනි ප්‍රනාන්දු (පුතා), එලිසබෙත් (දුව) |
| P 5770—1.1.51 | .. | සාමිනාතන් මාරිමුතු, හෝල්මවුඩ් වත්ත, අග්‍රපතන | පෙරුමයි (භාර්යාව), සාමිනාතන් (පුතා), මැරියායි (දුව), සුප්‍රමානියම් (පුතා), වල්ලියම්මා (දුව) |
| P 5785—16.1.51 | .. | කරුප්පන් සින්නයියා, හොල්මවුඩ් වත්ත, අග්‍රපතන හොල්මවුඩ් වත්ත, අග්‍රපතන | සෙල්ලම්මාල් (භාර්යාව) |
| P 5810—16.1.51 | .. | කරුප්පන් සින්නයියා, හොලම්වුඩ් වත්ත, අග්‍රපත. මුතුකරුප්පන් එගරාජ්, හොල්මවුඩ් වත්ත, අග්‍රපතන | ඉරුවාලායි (භාර්යාව), ෂන්මුගම් (පුතා), කනසු (පුතා), රාමසියා (පුතා), ජානකී (දුව), වේලු (පුතා), මෝහනුම් (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| P 5812 16.1.51 .. | මුතුකරුප්පන් එගරාජ්, හොල්මවුඩ් වත්ත, අග්‍රපතන | කරුප්පායී (භාර්‍යාව) |
| P 6943—18.2.51 .. | සෙන්ගන් පොන්නුසාමි, මාරියා වත්ත, ලිඳුල | පාප්පති (භාර්‍යාව), නාගම්මා (දුව), සෙල්වනායගී (දුව), රාජම්මා (දුව), පුෂ්පමනි (දුව), අමුර්තම් (දුව), සෙල්ලදුරෙයි (පුතා) |
| P 7229—5.3.51 .. | වෙල්ලායන් පොන්නන්, ජේපත්ලි කොටස ක්‍රොයිගී ලී වත්ත, පතන | නච්චායී (භාර්‍යාව), පූපති (දුව), අමරාවති (දුව) |
| P 7236—5.3.51 .. | අරසන් ගෝපාල්, ජේපත්ලි කොටස, ක්‍රොයි ලී වත්ත, පතන | පොන්නම්මාල් (භාර්‍යාව) |
| P 7408—31.10.50 .. | වර්නන් පවෙයිමුත්තු, බ්රේමෝර් වත්ත, අග්‍රපතන | අන්නම්මාල් (භාර්‍යාව) |
| P 7412—31.10.50 .. | වෙලායුතම් මුතුසාමි, බ්රේමෝර් වත්ත, අග්‍රපතන | පොන්නත්තාල් (භාර්‍යාව) |
| P 8151—3.5.51 .. | පෙරුමාල් රාමන්, පහළ කොටස, ක්‍රෑන්ලි වත්ත, ලිඳුල | රතිනම් (භාර්‍යාව), බාලසුප්‍රමානියම් (පුතා), රාසම්මා (දුව) |
| P 8999—12.5.51 .. | මුනියන්ඩි සන්දනම් ජේපාරස්ට් ක්‍රීක් කොටස ක්‍රොයිගී ලී වත්ත, පතන | ජානගී (දුව), අම්මවාසි (පුතා) |
| P 9524—18.7.51 .. | රාමසාමි පෙරියසාමි, මේරි ක්ලෙයාර් වත්ත, කොටගල | තෙයිවනේ නොහොත් කමලාම් (භාර්‍යාව), ජේයරාජ් (පුතා), රාමරජ් (පුතා), සුසීලරානි (දුව) |
| P 9592—2.8.51 .. | කරුපයියා සේරුවාසන් පොන්නයියා, ඉහළ කොටස, දිඹුල වත්ත, පතන | පාර්වති නොහොත් පොන්නාචි (භාර්‍යාව), වෙච්චුම් නොහොත් තනපක්කියම් (දුව), ලෙච්චුම් නොහොත් කමලාම් (දුව), යොගනාතන් (පුතා) |
| I 6484/P—27.7.51 .. | අන්නමලෙයි රාමලින්ගම්, බෝගහවත්ත, වත්ත, කොටගල | ශුණම්මා (භාර්‍යාව), මුනියප්පන් (පුතා), සිව පාලන් (පුතා) |
| K 12875/P—4.8.51 .. | සාතපිල්ලේ තෙවරාය පිල්ලේ, 68, හොල්බ්රුක් බසාර්, අග්‍රපතන | සිවපක්කියම් (භාර්‍යාව), සුබ්‍රමනියම් (පුතා) |
| NE 24/P—10.11.49 .. | සොලමුතු රාමසාමි, යතන්සයිඩ් වත්ත, කොටගල | මාරියායි නොහොත් මනෝමනි (භාර්‍යාව), කමලා (දුව), කනගරත්නම් (පුතා) |
| T 810—3.8.51 .. | නීරුනගතිල් කොප්පු වෙලායුතන්, 208, ඩයික් වීථිය, නො. 3 කොටස, ත්‍රිකුණාමළය | හෙට්ටිආරච්චිගේ පොඩිහාමි (භාර්‍යාව), වේලු (පුතා), ධම්දාස (පුතා), වසන්තරාජා (පුතා), සරස්වති (දුව) |
| T 1025—4.7.51 .. | ඔගස්තින් ජෝජ් සූසාගේ වැන්දඹුවවූ ජ්රෑන්සිනා, ඊස්ටර්න් බේකරිය, 181, ඩොක්යාඩ් පාර, ත්‍රිකුණාමළය | ඔගස්තිනා (දුව), ඇනට් (දුව), ජෝජ් (පුතා), බාබරා (දුව) |
| CC/3723/G/M/T—25.7.51 .. | තෙන්නකෝන් රන්ජිත් සුසිවෙන්, නො. 2 කොටස, කල්මුනෙයි | කාන්තිමති (භාර්‍යාව), පර්ල් තිලකමාලා (දුව), පර්සි බාලචන්ද්‍රා (පුතා) |
| V 8323/W/N—3.8.51 .. | පම්බයන් රාමසාමි, යෙල්වර්ටන් වත්ත, හාලිඇල | වල්ලියම්මා (භාර්‍යාව), පූර්ණම් නොහොත් තෙයිව නෙයි (දුව), තේවගී (දුව) රත්නපූපතී (දුව), පුෂ්පාවතී (දුව), ත්‍යාගලින්ගම් (පුතා) |

---

## වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥාපනත

වර්ෂ 1943 අංක 40 දරන ආඥාපනතින් හා වර්ෂ 1953 අංක 5 සහ 1957 අංක 27 දරණ පනත්වලින් සංශෝධිත වර්ෂ 1941 අංක 27 දරන කම්කරු පඩි සභා ආඥාපනතේ 28 වන වගන්තියෙන් තමන්ට ලැබී ඇති බලය පිට මීට යාව ඇති උප ලේඛනයෙහි සවිස්තරව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව අදහස් කරන බව එකී කම්කරු පඩි සභා ආඥාපනතේ 26 A වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව කීමට ඇති කරුණු, සලකා බැලීම සඳහා වර්ෂ 1959 ජූලි මස 24 වන දින දවල් 12 දක්වා එම පඩි සභාවේ සභාපති මහතා විසින් භාර ගන්නවා ඇත.

ඉදිරිපත් කරන සෑම විරුද්ධත්වයක් වශයෙන් එසේ විරුද්ධ වීමට හේතු භූත වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

සී. බී. කුමාරසිංහ,
බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ කම්කරු
පඩි සභාවේ සභාපති.

1959 ජූලි මස 1 වන දින,
කොළඹ දීය.

### උපලේඛනය

බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1957 නොවැම්බර් මස 29 වන දින අංක 11,208 දරන අතිවිශෙෂ ගැසට් පත්‍ර නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ තීරණ, එකී උපලේඛනයේ 2 වන කොටස වෙනුවට මෙහි පහත දක්වෙන අළුත් කොටස යෙදීමෙන් වෙනස් වේ.

### II වන කොටස

කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන්

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොල සූදානම් කිරීම, ඔතන කොල කැපීම, කැපූ එතුම් කොල "බීඩි දුම්කොළ" වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි නූල්වලින් බැඳීමද ඇතුලුව) "නූල්" බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩ වලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් වන්නේ—

(අ) දිග අඟල් 2 බීඩි 1,000ට රු. 5.00 යි,
(ආ) දිග අඟල් 2½ බීඩි 1,000ට රු. 6.00 යි, සහ
(ඇ) දිග අඟල් 3 බීඩි 1,000ට රු. 7.00 යි.

(කැපූ එතුම් කොල "බීඩි දුම්කොල" වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි නූල් වලින් බැඳීමද ඇතුළුව, එහෙත් බීඩි එතීම සඳහා කැපූ එතුම් කොල පිළියෙල කිරීම සහ ඔතන කොල කැපීම හැර) "නූල්" බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් වන්නේ—

(අ) දිග අඟල් 2 බීඩි 1,000ට රු. 3.34 යි,
(ආ) දිග අඟල් 2½ බීඩි 1,000ට රු. 4.00 යි, සහ
(ඇ) දිග අඟල් 3 බීඩි 1,000 ට රු. 4,66 යි,

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොල පිළියෙල කිරීම ද ඇතුළුව) ඔතන කොල කැපීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයක් වන්නේ—

(අ) දිග අඟල් 2 බීඩි 1,000 ට රු. 1.67 යි,
(ඇ) දිග අඟල් 3 බීඩි 1,000 ට රු. 2.34 යි.
(ඇ) දිග අඟල් 3 බීඩි 1,000 ට රු. 2.34 යි.

එතූ බීඩි වටා ලේබල් මුද්‍ර සවිකිරීම සඳහා කෑලි ගණනේ වැඩ වලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණය වන්නේ බීඩි 1,000 ට සත 50 කි."

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කළුතර දිස්ත්‍රික්කයේ 1958-59 යන වර්ෂවලදී ගවයින් හංවඩු ගැසීම සම්බන්ධ වැඩ සටහන

වර්ෂ 1943ක් වූ ඔක්තෝබර් මස 15 වෙනි දින පළවුණු අංක 9,181 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හංවඩු ගැසීම පිළිබඳ නීති මාලාවේ 3(3) වගන්තිය අනුව කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ, ගවයින් හංවඩු ගැසීමේ වැඩ සටහන මහජනයාගේ දැනගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඩබ්ලිව්. පතිරණ,
කළුතර දිසාපති තැන.

1959ක් වූ ජූලි මස 1 වෙනි දින,
කළුතර කච්චෙරියේදීය.

### 1958/59 අවුරුද්දේ ගවයින් නිවරණය කිරීම පිළිබඳ කාල සටහන

| ගම්මුලාදෑනි කොට්ඨාශය අංක හා නාම | | නිවරණය කරණ ස්ථාන | නිවරණය කරණ දිනය |
|---|---|---|---|
| 811 | කරන්නාගොඩ | ගම්මුලාදෑනිතැනගේ නිවස පිහිටි ඉඩම | 1959.8. 2 |
| 812 | දේවමුල්ල | එම | 1959.8 .6 |
| 813 | කොබවක | එම | 1959.8. 9 |
| 814 | ගෝවින්න | එම | 1959.8.13 |
| 815 | නාහල්ල | එම | 1959.8.16 |
| 816 | වරකාගොඩ | වරකාගොඩ මංසන්ධිය | 1959.8.20 |
| 817 | කුඩලිගම | ගම්මුලාදෑනි තැනගේ නිවස පිහිටි ඉඩම | 1959.8.23 |
| 818 | වෙයංගල්ල | එම | 1959.8.27 |
| 819 | මහගම උතුර | එම | 1959.8. 2 |
| 819ඒ | මහගම දකුණ | එම | 1959.8. 6 |
| 820 | දියකඩුව | එම | 1959.8. 9 |
| 821 | බුලත්සිංහල | එම | 1959.8.13 |
| 821ඒ | දෙල්මැල්ල | එම | 1959.8.16 |
| 822 | බෝතලේ | එම | 1959.8.20 |
| 822ඒ | හල්වතුර | එම | 1959.8.23 |
| 823 | යටගම්පිටිය | එම | 1959.8.27 |
| 824 | වෙල්ගම | එම | 1959.8.29 |
| 825 | මෝල්කාව | මෝල්කාව මංසන්ධිය අසල | 1959.8.31 |
| 826 | ඔමත්ත | ගම්මුලාදෑනි තැනගේ නිවස පිහිටි ඉඩම | 1959.8. 2 |
| 827 | පිඹුර | එම | 1959.8. 6 |
| 828 | උඩවෙල | එම | 1959.8. 9 |
| 829 | අගලවත්ත | එම | 1959.8.13 |
| 830 | වඳුරබ්බ | එම | 1959.8.16 |
| 832 | පින්නාගොඩ | එම | 1959.8.20 |
| 833 | කිතුල්ගොඩ | එම | 1959.8.23 |
| 834 | බෙල්ලන | එම | 1959.8.27 |
| 835 | ලත්පඳුර | එම | 1959.8. 2 |
| 836 | පැලෑද | එම | 1959.8. 6 |
| 836ඒ | මොරපිටිය | එම | 1959.8. 9 |
| 837 | මීදලන | එම | 1959.8.13 |
| 837ඒ | පැනිගල | එම | 1959.8.16 |
| 838 | හැඩිගල්ල | එම | 1959.8.20 |
| 839 | බඳුරලිය | එම | 1959.8.23 |
| 840 | කළුගල | එම | 1959.8.27 |
| 841 | අතලේ | එම | 1959.8.29 |
| 842 | බොරළුගොඩ | එම | 1959.8.31 |
| 843 | ඉහල හෙවෙස්ස | එම | 1959.8. 2 |
| 843ඒ | පහල හෙවෙස්ස | එම | 1959.8. 6 |
| 844 | රත්මලේ | එම | 1959.8. 9 |
| 845 | කුරුපිට | එම | 1959.8.13 |
| 846 | කෙව්ටියගල | එම | 1959.8.16 |
| 847 | කළුපහණ | එම | 1959.8.20 |
| 848 | මොරගල | මොරගල තානායම අසල | 1959.8.23 |
| 849 | මීගහතැන්න | ගම් මුලාදෑනි තැනගේ නිවස පිහිටි ඉඩම | 1959.8.27 |
| 850 | පැලවත්ත | එම | 1959.8.31 |

## ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර මාතලේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ ලග්ගල, පල්ලේගම වසමේ ගම්වල ගවයන් අතර "කුර සහ මුව" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශොධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:

උතුරට: කරුවලගොල්ල ඇල; දකුණට: කොළොන්ගොල්ලේ මුදුන; නැගෙනහිරට: එළුවන්කන්ද සහ නිකවතුර ඔය; බස්නාහිරට: තොරණබැදිඇල්ල සහ කදියාගාරුප්ප.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගව යන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයෑම තහනම් කරමි.

3. තවද, 1937දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිල ධාරීන් විසින් නිත්‍යානුකූලව ක්‍රියා කරන ලද අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මාතලේ පශු වෛද්‍ය තැනගෙන් හෝ නැගෙනහිර මාතලේ කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1950ක් වූ ජූනි මස 22 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේදීය.

---

## ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර මාතලේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගල්ගොඩවෙල වසමේ ගම්වල ගවයන් අතර "කුර සහ මුව" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශොධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:

උතුරට: වස්ගමු ඔය (පොළොන්නරුව සහ අක්කරහැඩියේ මායිම); දකුණට: බෝගහවැව (විල්ගමුව වසමේ මායිම); නැගෙනහිරට: මහවැලිගඟ (ඌවේ මායිම); බස්නාහිරට: නික වතුර ඔය (පල්ලේගම වසමේ මායිම).

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගව යන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයෑම තහනම් කරමි.

3. තවද, 1937දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිල ධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මාතලේ පශු වෛද්‍ය තැනගෙන් හෝ නැගෙනහිර මාතලේ කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයුසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959ක් වූ ජූනි මස 22 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේදීය.

## දැන්වීමයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වනසත්ව භාරකාර හා දිසාපති ඇන්. පී. විජයරත්න වන මම, වනසත්ව, වෘක්ෂලතාදිය පිළිබඳ ආඥාපනතේ 12 (1) දරණ ඡේදය යටතේ මෙහි පහත දක්වෙන මායිම් තුළ පිහිටි ප්‍රදේශය වල් අලියෙකු විසින් පාළු කිරීමෙහි යෙදී සිටින බව මෙයින් දනුම් දෙමි.

2. මා විසින් නොමිලයේ දෙනු ලබන අවසර පත ලබා ගෙන පහත කියැවෙන පෙදෙසේ සැරිසරන යට විස්තර දක්වෙන ඉහත කී මෙම වල් අලියා දඩයම් කිරීමට, වෙඩි තැබීමට, මැරීමට හෝ ඇල්ලීමට මෙයින් අවසර දෙනු ලැබේ.

3. **ඉහත කියැවුන පෙදෙස—**

හුරුළු පළාතේ උලගල්ල කෝරළයේ කඳු තුලානේ මොරගොඩ සත් දනන් කුලම සහ ලබුනෝරුව යන පෙදෙස ඇතුළත.

4. **වැඩි විස්තර පහත සඳහන් නිලධාරීන්ගෙන් ලබා ගැනීමට පිළිවන :—**

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයය, හුරුළු පළාත, කහට ගස්දිගිලිය ; පොලිස් සථානාධිපති, ගලෙන්බිඳුනුවැව හා වන සත්ව ආරක්ෂක නිලධාරි, උතුරු මැද පළාත, අනුරාධපුරය.

5. මවිසින් දෙනු ලබන බලපත්‍රය අද සිට මාස දෙකක් වලංගුවේ.

**වල් අලියාගේ විස්තර**

සාමාන්‍ය උස අඩි 8යි ;

පසු පස කකුලේ අඩි සලකුනේ වටප්‍රමාණය අඟල් 48යි ;

හඳුනා ගැනීමේ සලකුණු : මනාව වැඩුනු පිරිමි සතා.

ඩබ්ලිව්. ඒ. ඇස්. කනගසබේ,
ඇන්. පී. විජයරත්න වෙනුවට.

අනුරාධපුර දිසාපති හා දිස්ත්‍රික්ක වනසත්ව භාරකාර තැන.

දිසාපති කාර්යාලයය,
අනුරාධපුරය, 1959 ජූලි 1.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.